# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
### 2025 සැප්තැම්බර් /ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය
(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)

### බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍යය අධ්‍යයනය BUCU– E1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දීඝනිකාය මහාපරිනිබ්බාන සූත්‍රයෙන් හෙළිවන බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට නායකත්ව ලක්ෂණ විභාග කරන්න.

02. රාෂ්ට්‍ර පාලනයක් සඳහා උපයෝගී කරගත හැකි දේශපාලන මූලධර්ම මොනවාදැයි දීඝනිකායේ කූටදන්ත සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

03. ගිහි පැවිදි සබඳතාව පිළිබඳ සිගාල සූත්‍රාගත ඉගැන්වීම්වලින් දෙපාර්ශ්වයෙහි ම උභයාර්ථ සාධනයට අවකාශ ලැබෙන බව සාධනය කරන්න.

04. විමුක්ති චර්යාවෙහි ලා සෞන්දර්ය රසාස්වාදය බාධාවක් නොවන බව දීඝනිකාය සක්කපඤ්හ සූත්‍රය ඇසුරෙන් විභාග කරන්න.

05. භික්ෂුවගේ ආයති සංවරය අරමුණු කරගත් සේඛියා ධර්මයන්හි සමාජ උපයෝගීතාව විමර්ශනය කරන්න.

06. පුද්ගල චරිත විශ්ලේෂණයෙහි ලා ජාතක කථා කෙතෙක් දුරට උපයෝගී කරගත හැකිදැයි නිර්දේශිත ජාතක කථා තුනක් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

07. මහාකාව්‍යයක අන්තර්ගත විය යුතු ලක්ෂණ මොනවා දැයි කාව්‍යශේඛරය ඇසුරින් සමාලෝචනය කරන්න.

08. ලංකාවේ ස්තූප පිළිබඳව අධ්‍යයනය කරන්නෙකුට ථූපවංශයෙන් ලැබෙන ආලෝකය කෙබඳුදැයි විමර්ශනය කරන්න.

09. බුද්ධ චරිතයේ අවස්ථා තාත්වික ආකාරයෙන් ගෙනහැර පෑමෙහි ලා බුත්සරණ කතුවරයා දක්වා ඇති වර්ණනා කෞශල්‍යය අගයන්න.

10. උපදේශ සාහිත්‍යය වඩාත් වැදගත් වන්නේ වර්තමාන සමාජයට බව ලෝවැඩ සඟරාව අනුසාරයෙන් පෙන්වා දෙන්න.

***************************